# ණය යෝජනා ක්‍රම

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම 2010 වර්ෂයේ දී ආරම්භ කළ අතර, 1987 අංක 29 දරන පනත මඟින් ස්ථාපිත කරනු ලැබූ තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය විසින් ඒවා ක්‍රියාත්මක කරන ලදී. එකී යෝජනා ක්‍රම හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ලංකා බැංකුව සමඟ එක්ව මේ වන විට ද පවත්වා ගෙන යනු ලැබේ.

## ණය යෝජනා ක්‍රම

### 1. පීඩාවට පත් තැනැත්තන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

පිඩාවට පත් තැනැත්තන් හට ජීවනෝපාය මාර්ග සලසා ගැනීමටත් ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව මෙම ණය යෝජනා ක්‍රමය 2010 වසරේ සිට ක්‍රියාත්මක වේ.

### 2. සමාජගතකරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

එවකට පැවති පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නිර්දේශය ඇතිව 2012 වසරේදී මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මේ යටතේ සාර්ථකව පුනරුත්ථාපන වැඩසටහන් නිම කරමින් සමාජගත වූ අභ්‍යාසලාභීන් 12,000 ක පමණ ප්‍රමාණයකට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අත්වැලක් ලෙස මෙසේ ණය පහසුකම් ලබා දෙන ලදී.

### 3. නිවාස ණය යෝජනා ක්‍රමය

පීඩාවට පත් තැනැත්තන්ගේ අහිමි වූ/ හානියට පත් වූ නිවාස නැවත ගොඩනගා ගැනීම හෝ පිළිසකර කර ගැනීමට මූල්‍යමය සහාය ලබා දීමක් ලෙස 2010 වසරේ දී මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ උතුරු නැගෙනහිර පළාත්වල බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල වෙසෙන අවතැන් වූ පුද්ගලයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

## අදාල නිර්ණායක

- උපරිම ණය මුදල - රු. 250,000/=
- පොළී අනුපාතය - 4% වාර්ෂික
- නැවත ගෙවීමේ කාලය - එක් එක් සිද්ධියට අදාලව උපරිම වසර 07 ක්
- ණය සහන කාලය - ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත වසර 1 ක් දක්වා
- රක්ෂණය - බැංකුව විසින් අනුමත කරන ඇපකරුවන් දෙදෙනෙක්

# අයදුම්පත් පටිපාටිය

- අයදුම්පත් හානිපූරණය සඳහා වන කාර්යාලයෙන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා දිස්ත්‍රික්කයේ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත හැකිය. අයදුම්පත මෙහිදී බාගත කරගත හැකිය.

- විධිමත්ව සම්පූර්ණ කරන ලද, ග්‍රාම නිළධාරීවරයා හා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් විසින් සහතික කරන ලද අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් මඟින් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත එවිය යුතුය.

- ස්වයං රැකියා සඳහා වන අයදුම්පත්වල, ශක්‍යතාව මැන බැලීම සඳහා යෝජිත ස්වයං රැකියා ව්‍යාපෘතිය හා සම්බන්ධ සියළු තොරතුරු ඇතුළත් කළ යුතුය.

- අයදුම්කරු අදාල ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට සුදුසු ද යන්න සොයා බැලීම සඳහා සහ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමයන්ට අදාලව නම් ණය අයදුම්කරනු ලබන ව්‍යාපෘතියේ ශක්‍යතාවය මැන බැලීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ නිළධාරීන්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන්, අදාල බැංකු ශාඛාවේ නිළධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුව සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ණය අනුමත කරන්නේ නම්, අයදුම්කරු හට ලබා දීමට නිර්දේශිත ණය ප්‍රමාණය සහ ණය ආපසු ගෙවීමේ කාලය එකී මණ්ඩලය විසින් තීරණය කොට ලංකා බැංකුව වෙත නිර්දේශ කරනු ලැබේ.

- අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණයන් පිළිබඳ සෑහීමට පත්වන්නේ නම් බැංකුව විසින් අයදුම්කරු හට ණය මුදල මුදා හරිනු ලැබේ.

## ප්‍රගතිය අධීක්ෂණය කිරීම

හානිපූරණය සඳහා වන කාර්යාලයේ ක්ෂේත්‍ර නිළධාරීන් විසින් ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කර අවශ්‍ය පරිදි ණයලාභියා හට උපදෙස් ලබා දෙනු ලැබේ.

**2010 සිට 2021 අගෝස්තු මස අග භාගය දක්වා ප්‍රදානය කරනු ලැබූ ණය**

| අනු අං. | දිස්ත්‍රික්කය | ස්වයං රැකියා - පීඩාවට පත් තැනැත්තන් | | ස්වයං රැකියා – සමාජගතකරන ලද අභයාසලාභීන් | | නිවාස ණය - පීඩාවට පත් තැනැත්තන් | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රදානය කළ ණය සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද ණය මුදල් ප්‍රමාණය (රු.) | ප්‍රදානය කළ ණය සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද ණය මුදල් ප්‍රමාණය (රු.) | ප්‍රදානය කළ ණය සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද ණය මුදල් ප්‍රමාණය (රු.) |
| 1 | යාපනය | 1,955 | 340,005,000 | 711 | 142,336,000 | 144 | 35,400,000 |
| 2 | කිළිනොච්චිය | 934 | 135,475,000 | 541 | 90,684,000 | 148 | 32,200,000 |
| 3 | මුලතිව් | 354 | 61,970,000 | 609 | 117,210,000 | 153 | 37,800,000 |
| 4 | වවුනියාව | 378 | 55,244,000 | 346 | 55,675,000 | 44 | 10,550,000 |
| 5 | මන්නාරම | 374 | 66,515,000 | 336 | 62,400,000 | 180 | 39,200,000 |
| 6 | අම්පාර | 1,040 | 71,669,000 | 29 | 5,375,000 | 33 | 8,200,000 |
| 7 | ත්‍රිකුණාමලය | 258 | 41,630,000 | 163 | 35,500,000 | 56 | 13,700,000 |
| 8 | මඩකලපුව | 629 | 101,922,000 | 145 | 26,770,000 | 67 | 16,400,000 |
| 8 | අනෙක් දිස්ත්‍රික්ක | 18 | 3,825,000 | 5 | 1,150,000 | 4 | 1,000,000 |
| **මුළු එකතුව** | | 5,940 | 878,255,000 | 2,885 | 537,100,000 | 829 | 194,450,000 |

සියළු කාණ්ඩ සඳහා ප්‍රදානය කරනු ලැබූ මුළු ණය සංඛ්‍යාව **- 9,654**
ණය වශයෙන් ලබා දුන් මුළු ගණන - රු. බිලියන **1.6**